© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය

## අන්තර්මධ්‍ය අදියර

## 2010 මාර්තු විභාගය

| | | | |
|---|---|---|---|
| විභාග දිනය | : 2010 අප්‍රේල් 03 | පිටු ගණන | : 05 |
| විභාග වේලාව | : ප.ව. 1.30 - ප.ව. 4.30 | ප්‍රශ්න ගණන | : 05 |

අයදුම්කරුවන්ට උපදෙස්:

1. නියමිත කාලය පැය 3 කි.
2. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| බදුකරණය | (TAX / 605) |

---

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 35)*

දේශීය වෙළඳපොළට වතුර බෝතල් නිෂ්පාදනය කරන සීමාසහිත වෝටර්ටෙක්ස් සමාගම, තක්සේරු වර්ෂ 2008/2009 ට පහත සඳහන් විස්තර සපයා ඇත.

තක්සේරු වර්ෂ 2008/2009 ට ව්‍යවස්ථාපිත ආදායම, තක්සේරු කළ හැකි ආදායම, බදු අයකළ හැකි ආදායම හා ගෙවිය යුතු බද්ද ගණනය කරන්න.

සමාගම තක්සේරු වර්ෂ 2003/04 දී, ව්‍යාපාරය පටන් ගන්නා ලදී. වෙනත් වර්ෂයක මිලට ගත් බව සඳහන් කර ඇති වත්කම් හැර, සියලුම වත්කම් තක්සේරු වර්ෂ 2003/2004 දී මිලට ගන්නා ලදී.

(i) බද්දට පෙර ශුද්ධ ලාභය රු. 30,000,000/- කි.

(ii) ශුද්ධ ලාභය ගණනය කිරීමට පෙර පහත සඳහන් වියදම් ලාභාලාභ ගිණුමට අයකර ඇත.

| | | රු. |
|---|---|---|
| a) | මෝටර් රථය විකිණීමෙන් අලාභය | 80,000 |
| b) | ප්‍රචාරක | 490,000 |
| c) | සංග්‍රහ | 300,000 |
| d) | පරිත්‍යාග | 260,000 |
| e) | නීති වියදම් | 40,000 |
| f) | බොල් ණය වෙන්කිරීම | 600,000 |
| g) | ලාභාලාභ ගිණුමට අය කළ ක්ෂයවීම් | 1,602,000 |
| h) | කළමනාකාර අධ්‍යක්ෂකට සපයා ඇති නිවාසයට ගෙවූ කුලිය | 720,000 |
| i) | විධායක නිලධාරියෙක් වන සිල්වා මහතා පාවිච්චි කරන මෝටර් බයිසිකලයට ගෙවූ බදු කුලිය | 50,000 |

(iii) සමාගමේ වෙනත් ආදායම් පහත සඳහන් ය.

| | | රු. |
|---|---|---|
| a) | භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් පොලී - ශුද්ධ | 180,000 |
| b) | රඳවාගැනීමේ බද්ද අඩුකර, වෙනත් නේවාසික සමාගමකින් ලැබුණු ලාභාංශ | 54,000 |
| c) | යන්ත්‍රයක් විකිණීමෙන් ලාභය | 40,000 |

| (iv) වත්කම් | 2008/04/01 ශේෂය (රු.) | එකතුකිරීම් (රු.) | ඉවත්කිරීම් (රු.) | 2009/03/31 ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 10,000,000 | 3,000,000 | 0 | 13,000,000 |
| යන්ත්‍ර හා උපකරණ | 7,000,000 | 1,200,000 | 800,000 | 7,400,000 |
| මෝටර් රථ වාහන | 4,000,000 | 2,000,000 | 1,000,000 | 5,000,000 |
| ගෘහ භාණ්ඩ | 980,000 | 0 | 0 | 980,000 |
| පරිගණක | 400,000 | 110,000 | 0 | 510,000 |
| පරිගණක මෘදුකාංග | 300,000 | 60,000 | 0 | 360,000 |

| ක්ෂයවීම් | 2008/04/01 ශේෂය (රු.) | වර්ෂයට අයකිරීම (රු.) | ඉවත්කිරීම් (රු.) | 2009/03/31 ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 2,300,000 | 500,000 | 0 | 2,800,000 |
| යන්ත්‍ර හා උපකරණ | 3,400,000 | 770,000 | 450,000 | 3,720,000 |
| මෝටර් රථ වාහන | 1,650,000 | 550,000 | 650,000 | 1,550,000 |
| ගෘහ භාණ්ඩ | 980,000 | 0 | 0 | 980,000 |
| පරිගණක | 400,000 | 20,000 | 0 | 420,000 |
| පරිගණක මෘදුකාංග | 300,000 | 12,000 | 0 | 312,000 |
| | | 1,852,000 | | |

(a) ව්‍යාපාරය පටන්ගත් වර්ෂයේ ගොඩනැගිල්ල මිලට ගන්නා ලදී. එකතුකිරීම් ලෙස පෙන්වා ඇත්තේ ඉදිකරගෙන යන කාර්යාල ගොඩනැගිල්ල ය. 2009 ඔක්තෝබර් මාසයේ කාර්යාලය අලුත් ගොඩනැගිල්ලට ගෙන යැමට, සමාගම බලාපොරොත්තු වේ.

(b) වර්ෂය තුළ දී යන්ත්‍රයක් විකුණා ඒ වෙනුවට වෙනත් යන්ත්‍රයක් මිල දී ගෙන ඇත.

(c) කළමනාකාර අධ්‍යක්ෂ පාවිච්චි කරන මෝටර් රථය හැර අනෙක් සෑම මෝටර් රථයක්ම 2003/2004 වර්ෂයේ මිලට ගෙන ඇත. කළමනාකාර අධ්‍යක්ෂගේ මෝටර් රථය 2005/2006 වර්ෂයේ මිලට ගෙන ඇත. මේ රථය විකුණා, එය වෙනුවට අලුත් ජීප් රථයක් ගෙන ඇත. කළමනාකාර අධ්‍යක්ෂගේ වාර්ෂික වැටුප රු. 2,000,000/- කි.

(d) පරිගණක මෘදුකාංග ලංකාවේ සාදන ලදී.

(v) 2008 ඔක්තෝබර් මාසයේ මෝටර් බයිසිකලයක් කල්බදු ක්‍රමය යටතේ ගන්නා ලදී. වර්ෂ තුනක් තුළ, රු. 75,000/- ක පොලී මුදලක් ඇතුළත්ව, ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය රු. 300,000/- කි.

| (vi) ප්‍රචාරක | රු. |
|---|---|
| සමාගමේ පුරප්පාඩු දන්වා දේශීය පුවත්පත්වල දැන්වීම් | 150,000 |
| භාණ්ඩ දේශීය පුවත්පත්වල ප්‍රචාරය කිරීම | 190,000 |
| භාණ්ඩ පිටරට සඟරාවක ප්‍රචාරය කිරීම | 150,000 |

| (vii) සංග්‍රහ | රු. |
|---|---|
| සියලුම අධ්‍යක්ෂවරුන් තරුපහේ හෝටලයක සංග්‍රහ කිරීම | 140,000 |
| වෙළඳ ගනුදෙනුකරුවන් වෙනුවෙන් සංග්‍රහ කිරීම | 160,000 |

| (viii) පරිත්‍යාග | රු. |
|---|---|
| වැඩිහිටියන් බලාගන්නා ආයතනයකට පරිත්‍යාග කළ වතුර බෝතල් | 260,000 |

(ix) නීති වියදම්
මාර්ග නීති නොපිළිපැදීමේ වරදකට උසාවියේ ගොනුකළ වරදක් සම්බන්ධව සමාගමේ රියදුරුට විරුද්ධව දමා තිබූ නඩුවක් වෙනුවෙන් නීති වියදම් දරණ ලදී. මෙම නඩුවේ දී රියැදුරු නිවැරදිකරුවකු ලෙෂ ප්‍රකාශ කරන ලදී.

(x) **බොල් ණය වෙන්කිරීමේ ගිණුම**

| | | | | |
|---|---|---|---|---|
| කපාහැරිය බොල් ණය | | 380,000 | ආරම්භක ශේෂය - පොදු | 200,000 |
| අවසාන ශේෂ | | | අයකරගත් බොල් ණය | 80,000 |
| පොදු | 400,000 | | ලාභාලාභ ගිණුම | 600,000 |
| විශේෂ | 100,000 | 500,000 | | |
| | | 880,000 | | 880,000 |

(a) අධික අලාභ නිසා වසා දැමූ සමාගමක් වෙනුවෙන් විශේෂ බොල් ණය ප්‍රතිපාදනය ඇති කරන ලදී.

(b) කපාහැරිය බොල් ණය අයකරගත නොහැකි ඒවා ය.

(c) අයකරගත් බොල් ණයවලින් රු. 50,000/- ක්, බොල් ණය ලෙස කැපූ අවස්ථාවේ දී තක්සේරුකරු ඉඩ නුදුන් ප්‍රමාණයක් ය.

(මුළු ලකුණු 35)

**<u>ප්‍රශ්න අංක 02</u>** *(ලකුණු 30)*

මිනින්දෝරුවෙක් ලෙස රක්ෂාව කළ තෙවරප්පෙරුම මහතා 2008 සැප්තැම්බර් 30 දා, වයස අවුරුදු 60 ක් වූ විට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. 2008 ඔක්තෝබර් 01 දා සිට, ඔහු සීමාසහිත සර්වෙක්ස් පුද්ගලික සමාගමේ සේවය ආරම්භ කරන ලදී.

තක්සේරු වර්ෂ 2008/2009 ට අදාළ පහත සඳහන් තොරතුරු අනුව ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායම, තක්සේරු කළ හැකි ආදායම, බදු අයකළ හැකි ආදායම හා ඔහු විසින් ගෙවිය යුතු ඉතිරි බද්ද ගණනය කරන්න. බදු නිදහස් ආදායම හා ව්‍යවස්ථාපිත ආදායමට එකතු නොවන ආදායම් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

| | | රු. |
|---|---|---|
| (i) | 2008 සැප්තැම්බර් 30 දා තෙක් රජයේ සේවයේ වැටුප | 180,000 |
| | රජයෙන් ලැබුණු දිරි දීමනාව | 60,000 |
| | රජයෙන් ලැබුණු විශ්‍රාම වැටුප | 150,000 |

| | | රු. |
|---|---|---|
| (ii) | සමාගමෙන් මාස හයට ලැබුණු වැටුප | 420,000 |

කොළඹින් පිට වාසය කිරීම අවශ්‍ය බැවින්, සමාගම කුලී රහිත නිවසක් ඔහට සපයන ලදී. මාස 6 වෙනුවෙන් සමාගම මෙම නිවසට රු. 240,000/- ක කුලියක් ගෙවන ලදී. මෙම නිවසෙහි වර්පනම් තක්සේරුව රු. 20,000/- ක් වූ අතර, 10% බැගින් වරිපනම් ගෙවන ලදී.

ඔහුගේ ගමන් බිමන් සඳහා සමාගම ඔහුට 2000cc එන්ජින් ධරිතාවයක් ඇති කාර් රථයක් ලබා දී ඇත.

සමාගමේ ග්‍රාහකයින් ඔහුගේ නිවසේ දී සංග්‍රහ කිරීමට වැය වූ රු. 40,000/- ඔහුට ආපසු ගෙවා ඇත.

(iii) ඔහු වාසය කළ ඔහුගේ නිවස 2008 ඔක්තෝබර් 01 දා සිට විදේශිකයෙකුට රු. 40,000/- ක වාසික කුලියට දී ඇත. මුළු වර්ෂයටම අදාළ රු. 8,000/- ක් වරිපනම් තෙවරප්පෙරුම මහාත ගෙවා ඇත. ඔහු වර්යට දැරූ අලුත්වැඩියා කිරීමේ වියදම් රු. 50,000/- කි. 2000 වර්ෂයේ මිලට ගත් මෙම නිවසෙහි වරිපනම් තක්සේරුව රු. 40,000/- කි.

(iv) මෙම නිවාසය මිලට ගැනීමට ගත් බැංකු ණය වෙනුවෙන් වර්ෂය තුළ දී රු. 20,000/- ක් පොලී ලෙස ගෙවා ඇත. තවද නිවාසය අලුත්වැඩියා කිරීමට ගත් ණය මුදලක් වෙනුවෙන් ඔහු රු. 10,000/- ක් පොලී ලෙෂ ගෙවා ඇත.

(v) ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබුණු පොලිය

| | | රු. |
|---|---|---|
| ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් | | 180,000 (දළ) |
| සම්පත් බැංකුවෙන් | 40,000 | |
| අඩුකළා: 10% | 4,000 | 36,000 |

(vi) ඔහුගේ වැටුපෙන් 8% ක් ඔහු සේවක අර්ථසාධක අරමුදලට ගෙවයි. සේවායෝජකයා ඔහු වෙනුවෙන් 12% ක් ගෙවයි.

(vii) අනුමතපුණ්‍යායතනයකට මුදලින් රු. 200/- ක් හා එකක් රු. ක් බැගින් ලක්ස්ප්‍රේ පැකට් 100 ක් ප්‍රදානය කරන ලදී.

(viii) මෙම කාලයට අඩු කළ උපයන විට ගෙවීම් බද්ද රු. 5,000/- කි.

**(මුළු ලකුණු 30)**

**<u>ප්‍රශ්න අංක 03</u>** *(ලකුණු 16)*

(a) 2009 ජනවාරි මස 01 දින ආරම්භ වන කාලවලට බදු අය කළහැකි ක්‍රියාකාරකමක් කරගෙන යන තැනැත්තෙක් එකතු කළ අගය මත බද්දට (වැට් බද්දට) ලියාපදිංචි විය යුත්තේ කුමන කොන්දේසි යටතේ ද යනු දක්වන්න.

(b) ව්‍යාපාරයක් සපයා ඇති පහත සඳහන් විස්තර අනුව 2009 ජනවාරි මාසයේ දී ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද ගණනය කරන්න.

බද්දට ලියාපදිංචි නොවූ තැනැත්තන්ට කළ විකුණුම් හැර, පහත සඳහන් සියලුම ප්‍රමාණයන් අදාළ එකතුකළ අගය මත බද්ද එකතුකිරීමට පෙර ප්‍රමාණයන් ය. බද්දට ලියාපදිංචි නොවූ අයට කළ විකුණුම්වල එකතුකළ අගය මත බද්ද ඇතුළත් ය.

| | රු. |
|---|---|
| සුඛෝපභෝගී අනුප්‍රමාණය යටතේ විකුණුම් | 1,500,000 |
| ප්‍රමිති අනුප්‍රමාණය යටතේ විකුණුම් | 2,800,000 |
| ලියාපදිංචි නොවූ අයට ප්‍රමිති අනුප්‍රමාණය යටතේ විකුණුම් | 600,000 |
| ප්‍රමිති අනුප්‍රමාණය යටතේ මිලට ගත් යන්ත්‍රයක් | 2,000,000 |
| ප්‍රමිති අනුප්‍රමාණය යටතේ මිලට ගැනුම් | 2,500,000 |
| ප්‍රමිති අනුප්‍රමාණය යටතේ වියදම් | 800,000 |
| ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් ගැනුම් | 900,000 |

(c) මෙම මාසය තුළ දී ගෙවූ එකතුකළ අගය මත බදුවලින් යම් ප්‍රමාණයක් ඊළඟ මාසයට ඉදිරියට ගෙන යා හැකි ද? එසේ හැකි නම් ඒ කුමන ප්‍රමාණයක් ද?

**(මුළු ලකුණු 16)**

**ප්‍රශ්න අංක 04** *(ලකුණු 14)*

ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ධර්මවංශ මහතා, ව්‍යාපාරය පටන් ගැනීමට පෙර බදු සම්බන්ධව ඔබගෙන් උපදෙස් ලබාගැනීමට අදහස් කරයි.

ඔහු පහත සඳහන් තොරතුරු සපයයි.

(i) ඔහු රු. 2,000,000/- ක් ප්‍රාග්ධනය ලෙස යෙදවීමට අදහස් කරයි. මේ මුදල සපයා ගැනීමට ඔහු ඔහුගේ කුරුණෑගල පිහිටි නිවස විකිණීමට බලාපොරොත්තු වේ. මෙම නිවස ඔහු 1990 දී රු. 1,500,000/- ක් වැයකර ඉදිකරන ලදී.

(ii) ඔහුගේ මාසික විකිණීම රු. 600,000/- ක් ඉක්මවා යන බවට බලාපොරොත්තු වේ.

(iii) (a) ගණකාධිකරණ සුදුසුකමක් ඇති ඔහුගේ භාර්යාව රු. 45,000/- ක මාසික වැටුපකට සේවයේ යොදවා ඇත.
(b) රු. 15,000/- සිට රු. 25,000/- ක මාසික වැටුප් මට්ටමකට, ඔහු බඩු විකිණීමට සේවකයන් තුන් දෙනෙක් සේවයේ යොදවා ඇත.

(iv) දෑවැද්ද ලෙස ඔහුට ලැබුණු, භාර්යාවට අයත් ගොඩනැගිල්ලක ඔහු ව්‍යාපාරය පවත්වාගෙන යයි. ඇයට රු. 45,000/- ක මාසික කුලියක් ගෙවයි. මේ ගොඩනැගිල්ල වෙනුවෙන් වරිපනම් ගෙවීමට හා අලුත්වැඩියා වියදම් දැරීමට ඔහු භාරරගෙන ඇත. වර්ෂය අදාළ වරිපනම් රු. 15,000/- කි. මේ ගොඩනැගිල්ල වර්ෂය තුළ දී බද්දට දී නැත.

(v) ව්‍යාපාරය පටන්ගන්නා විට, 2009 ජනවාරි මාසයේ දී ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා පරිගණක යන්ත්‍ර දෙකක් මිලට ගන්නා ලදී.

පහත සඳහන් කරුණු සම්බන්ධව ඔහු උපදෙස් ඉල්ලයි. (තක්සේරු වර්ෂ 2005/2006 ට අදාළ නීතිය යොදා පිළිතුරු සැපයිය යුතුයි.)

(i) නිවාසය විකිණීමෙන් ලැබෙන ලාභයට ඔහු බදු ගෙවිය යුතු ද? පැහැදිලි කරන්න.

(ii) භාර්යාව ඇයට ලැබෙන වැටුප බද්දට යටත් ද? හේතු දක්වන්න.

(iii) ව්‍යාපාරයේ බඩු විකිණීමට ගන්නා සේවකයන් වෙනුවෙන්, ඔහු උපයන විට ගෙවීමේ බද්දට ලියාපදිංචි විය යුතු ද? හේතු දක්වන්න.

(iv) ඔහු භාර්යාවට ගෙවන කුලිය ව්‍යාපාරයේ වියදමක් ලෙස සැලකිය හැකි ද?

(v) ඔහු 2009 ජනවාරි මාසයේ ව්‍යාපාරය ආරම්භ කළ ලෙස උපකල්පනය කර, භාර්යාවගේ 2008/2009 තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත කුලී ආදායම කොපමණ ද? පැහැදිලි කරන්න.

(vi) ඔහු 2009 ජනවාරි මාසයේ පරිගණක යන්ත්‍ර මිලට ගත් බැවින් ඔහුට සම්පූර්ණ ක්ෂය දීමනාව ලබාගත හැකි ද? පැහැදිලි කරන්න.

(vii) ඔහු ව්‍යාපාරය පටන් ගන්නේ ජනවාරි මාසයේ බැවින් ඔහුට කැලැන්ඩර් වර්ෂය පදනම් කරගෙන ගිණුම් තබාගත හැකි ද? පැහැදිලි කරන්න.

(viii) ඔහු එකතුකළ අගය මත බද්ද ගෙවීමට යටත් ද? හේතු දක්වන්න.

**(මුළු ලකුණු 13)**

**ප්‍රශ්න අංක 05** *(ලකුණු 06)*

දේශීය ආදායම් පනතේ 76 වන වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයක ''බෙදිය හැකි ලාභය'' ගණනය කරන්නේ කෙසේ ද?

**(මුළු ලකුණු 06)**

***ප්‍රශ්න පත්‍රය අවසානයි***